# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 16 දරන
# ආගාමික හා විගාමික (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අප්‍රේල් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 16 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඔ 70/90.

**ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 16 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආගාමික හා විගාමික පනතේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 351 වන අධිකාරයේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ඉ) ඡේදයේ "අවහිර කරන; හෝ" යන වචන වෙනුවට "අවහිර කරන;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (එ) ඡේදය, එහි (ච) ඡේදය ලෙස නැවත අකුරු යෙදීමෙන්;

(ඇ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්;

"(එ) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නා වූ ද ගමන් ලේඛනයක ධාරකයා වන්නා වූ ද තැනැත්තකුව සිටිමින්, පාලකවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, ඒ ගමන් ලේඛනය ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින තැනැත්තකුට, තැපෑලෙන් හෝ වෙනත් තැනැත්තකුගේ මාර්ගයෙන් එවන හෝ ප්‍රේෂණය කරන;

(ඒ) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නා වූ ද ගමන් ලේඛනයක ධාරකයා වන්නා වූද තැනැත්තකුව සිටිමින්, පාලකවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, එම ගමන් ලේඛනය, ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් රටක පදිංචිව සිටින තැනැත්තකුට තැපෑලෙන් හෝ වෙනත් තැනැත්තකුගේ මාර්ගයෙන් යවන හෝ ප්‍රේෂණය කරන;

(ඔ) තමාට නිකුත් කරන ලද්දා වූ ද තත් කාලයේ බලපවත්නා වූ ද ගමන් ලේඛන එකකට වැඩි ගණනක් තම සන්තකයේ තබා ගන්නා;

(ඔ) තමා වෙත නිකුත් කරන ලද්දා වූද තත් කාලයේ බලපවත්නා වූ ද ගමන් ලේඛනයක සන්තකය ඇතුව සිටිමින්, ගමන් ලේඛනයක් තමාට නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් කරන ;

(ක) වෙනත් යම් තැනැත්තකුගේ ගමන් ලේඛනයක්, නීත්‍යානුකූල බලයක් නොමැතිව තමා සන්තකයේ තබාගන්නා ;

(ග) තමා වෙත නිකුත් කරන ලද්දා වූ ගමන් ලේඛනයක් පරිරෝධනය කරමින් 51ඇ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් බලපවත්නා කාලය ඇතුළත වෙනත් ගමන් ලේඛනයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් කරන ;";

(ඇ) "වරදකරු කරනු ලැබීමෙන් පසු" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන වෙනුවට "වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5) මේ වගන්තියේ "ගමන් ලේඛනය" යන යෙදුමෙන්, ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් හෝ 1956 ආගාමික හා විගාමික නියෝග යටතේ නිකුත් කරන ලද හදිසි සහතිකයක් හෝ අනන්‍යතා සහතිකයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. 51ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 51ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"චූදිතයකු, සැකකරුවකු හෝ සාක්ෂිකරුවකු පැමිණ සිටීම සලස්වා ගැනීම සඳහා අධිකරණය විසින් ගමන් ලේඛනය පරිරෝධනය කළ හැකි බව.

51ඇ. (1) යම් නීතියක් යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තක දී චූදිතයකු හෝ සැකකරුවකු පැමිණ සිටීම හෝ සාක්ෂිකරුවකු විභාග කිරීම අවශ්‍ය බව අධිකරණයට පෙනී යන කවර හෝ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ චූදිතයාට, සැකකරුට හෝ සාක්ෂිකරුට නිකුත් කර ඇත්තා වූ ද තත් කාලයේ බලපවත්නා වූ ද යම් ගමන් ලේඛනයක්, ඒ චූදිතයා

හෝ සැකකරු පැමිණ සිටීම සලස්වා ගැනීම හෝ එම සාක්ෂිකරු විභාග කිරීම සඳහා අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන කාලසීමාවක් සඳහා අධිකරණය විසින් පරිරෝධනය කළ හැකි ය. යම් තැනැත්තකුට නිකුත් කරන ලද ගමන් ලේඛනයක් පරිරෝධනය කරමින් මේ වගන්තිය යටතේ ආඥාවක් කරන අධිකරණයක් විසින් ඒ ආඥාවේ පිටපතක් පාලකවරයාට ප්‍රේෂණය කිරීමට සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තියේ "ගමන් ලේඛනය" යන යෙදුමෙන් ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් හෝ 1956 ආගාමික හා විගාමික නියෝග යටතේ නිකුත් කරන ලද හදිසි සහතිකයක් හෝ අනන්‍යතා සහතිකයක් අදහස් වේ.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**පාර්ලිමේන්තුවේ** සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. **(විදේශීය)** රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.